සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

RICHMOND COLLEGE LIBRARY GALLE

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/විභාග අංකය :- ......................................................................................... කාලය : පැය 02 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

---

### I කොටස

- ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන අර්ථය සහිත යෙදුම තෝරන්න.

(1) "නරියා උඩ බලාගෙන හයියෙන් අඬපාලා ඇහුවා. ඈ අප්පේ කාට දුකුමක් ද ඔය තඩේ ගෙනියන්නෙ?" කියලා.

(1) 'හූ' කියා (2) ශබ්ද කර (3) කෑ ගසා (4) අත්පුඩි ගසා

(2) සුදහ ගින්දරේ පසු වන වැද්දන්ගේ බඩට වුවමනා කරන්නේ රසයට වඩා ආහාර ප්‍රමාණය වැඩි වීමකි.

(1) වේදනාවෙන් (2) බඩගින්නෙන් (3) වෙහෙසවීමෙන් (4) දැඩි උණුසුමෙන්

(3) මහප්‍රාණ අක්ෂරයක් සහිත වචනය කුමක් ද?

(1) අවබෝධය (2) නුවණ (3) ළමයා (4) අක්ෂර

(4) උක්ත පද පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) පිරිසක්, ළමයෙකු (2) ළමයින්, ගුරුවරු (3) කාන්තාවක්, මිනිසුන් (4) ළමයි, ගුරුවරයෙක්

(5) 'රූපය' යන පදයේ පිල්ලම කුමක් ද?

(1) දීර්ඝ ඇදපිල්ල (2) ඇලපිල්ල (3) දීර්ඝ පාපිල්ල (4) ගැටපිල්ල

(6) "අපි" යන පදය;

(1) උත්තම පුරුෂ බහුවචන පදයකි (2) උත්තම පුරුෂ ඒකවචන පදයකි. (3) ප්‍රථම පුරුෂ බහුවචන පදයකි. (4) මධ්‍යම පුරුෂ බහුවචන පදයකි.

(7) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය කුමක් ද?

(1) මර්දනය (2) පුස්ථකාල (3) ප්‍රශ්ණ (4) ප්‍රතම

(8) "ආගන්තුක" යන පදයට විරුද්ධ පදය කුමක් ද?

(1) ස්වදේශික (2) නේවාසික (3) සාමාන්‍යය (4) විශේෂ

(9) "ළපටි ගොයම් දලුත් එක්ක නටන්න මං ආසයි" මෙම කවි පදයේ විශේෂණ පදය කුමක් ද?

(1) ගොයම් (2) ළපටි (3) නටන්න (4) එක්ක

(10) ජය ලැබූ සෙබළු <u>දෙරණ</u> සිප ගත්හ.

ඉරි ඇඳි පදයට සමාන පදයක් ලියන්න. ..............................................................................

(11) ඔබට යහපතක් වේවා

ඉහත සඳහන් වාක්‍යය විරාම ලකුණු යොදා නැවත ලියන්න.

.........................................................................................................................................

- පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය වරහන තුළින් තෝරා ලියන්න.

(12) ..................................................................... පෙරහැර අලංකාර කරති. (ඇත්තු / ඇතුන්)

(13) ..................................................................... සුළඟින් සෙලවෙයි. (වෘක්ෂ / වෘක්ෂයෝ)

(14) දුම්රිය සෙමින් ධාවනය ..................................................................... (වෙති / වෙයි)

(15) මව දරුවන් ..................................................................... (රකින්නීය / රක්කෝ ය.)

(16) මම පුවත්පත ..................................................................... (කියෙව්වාය / කියවූවෙමි)

- පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

(17) දී කිරට ..................................................................... සාක්කිලු.

- 18 - 20 ප්‍රශ්නවල සඳහන් වාක්‍යය සඳහා සුදුසු පද වරහන තුළින් තෝරා ලියන්න.

(18) හේනේ .................................................. වෙත ගිය ඔහු සරුවට වැඩී තිබුණු ..................................................
දැක සතුටු වූයේය. (පැළ/පැල)

(19) වෙහෙසට පත් වූ වෙළෙන්දා .................................................. බිම තබා කොස් ..................................................
මත වාඩි විය. (කද / කඳ)

(20) .................................................. පුරා ඇවිද ගිය සමන්ගේ පාදයේ තිබූ ..................................................
ඔහුට වේදනාකාරී විය. (වණය / වනය)

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) ඔබ පාසලේ පුස්තකාලයෙන් ලබාගත් පොතක් සම්බන්ධව පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පොතේ නම : .................................................................................................... (ලකුණු 02)

(ii) පොතේ කර්තෘ : ................................................................................................ (ලකුණු 02)

(iii) කියවූ කතාව කෙටියෙන් විස්තර කරන්න. : ..................................................................

..........................................................................................................................

..........................................................................................................................

.......................................................................................................................... (ලකුණු 04)

(iv) ඔබට එම කතාවෙන් ගත හැකි ආදර්ශය කුමක් ද?

.......................................................................................................................... (ලකුණු 02).

(2) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 150කට නො අඩු රචනයක් ලියන්න.

(i) පාසලෙන් අපට  අපෙන් පාසලට

(ii) මා හයවන ශ්‍රේණියට ඇතුළත් වූ දා

(iii) මිහිකත සුරකින තුරුලිය

(iv) උඩු ගුවනේ සංචාරයක යෙදුණෙමි. (ලකුණු 20)

(3) ඔබ ගිය විනෝද චාරිකාවක් පිළිබඳ ඔබගේ මිතුරෙකුට/මිතුරියකට ලිපියක් ලියන්න. (ලකුණු 10)

(4) පහත සඳහන් උද්ධෘත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) "එකඟ වෙන්න ඕනෑ කාරණය මෙකයි."

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් කෘතිය කුමක් ද?

(ආ) එම කෘතිය සම්පාදනය කළේ කවරෙක් ද?

(ii) උදැල්ල හා කැත්ත කරේ  තබාලා

සැහැල්ලුවෙන් බෝම දෙපානගාලා

........................................  ..........

........................................  ..........

ඉහත කවියේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

(iii) "කුමක් නිසා උනු ද? පොකුණට බැස පැන් බොව."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(iv) ඉර උදා වන්නට
පළමුව නැඟිට සිහිකොට

(අ) මෙම කවිය ඇතුළත් කෘතිය නම් කරන්න.

(ආ) එහි කතුවරයා කවරෙක් ද?

(v) "පෙර කිසි කලෙ කැ නොවූ වෙනසක් මගේ සිතට දැනෙන්නට වියැ."

(අ) මෙසේ සිතුවේ කවරෙක් ද?

(ආ) සිතට වෙනසක් දැනුණේ කුමක් දැකීමෙන් ද?

(ලකුණු 2 X 5 - 10)

(5) **පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අප සිටියේ ගස් කොළන් තුනී වූ පෙදෙසක බැවින්, පෙරට වඩා ඉක්මනින් අපට ගමන් කළ හැකි විය. පැයක් පමණ වේලා ගමන් ගත් අපට, ඉදිරියෙන් මොකක් දෝ සතකු ගොරවන හඬක් ඇසිණ. අපි තිගැස්සී, ඉදිරියට නො ගොස්, පරෙස්සම් සහිත ව සිටියෙමු. හඬ නැවත නැවතත් ඇසිණි. දැන් එකකුගේ නොව, දෙදෙනෙකුගේ හෝ ඊට වැඩි දෙනෙකුගේ ගෙරවීම හා බිරීම වැනි බියකරු හඬක් ඇසෙන්නට විය. හඬ ඇසුණු හැටියෙන් අපට හැඟුණේ ඔවුන් එකිනෙකා හා පොරකමින් සිටි බව ය. ටික වේලාවක් ගත වූයේ සතුන් පොරකන හඬ දැන් ළඟින් ම ඇසිණ. මොහොතකට පසු, ගස් පඳුරු අතරින් දුවැන්ත වලසුන් තිදෙනෙකු ඉදිරියට එනු අපි දිටිමු.

(i) මොවුන් ඉදිරියට පැමිණියේ කවුද?..............................................................................

(ii) ඔවුන් කොපමණ වේලාවක් ගමන් ගත්තේ ද? ..............................................................................

(iii) මොවුන්ට ඉක්මනින් ගමන් කිරීමට හැකියාව ලැබුණේ ඇයි? ..............................................................................

(iv) ඡේදයෙන් යුගල පදයක් උපුටා ලියන්න. ..............................................................................

(v) අනුක්ත පදයක් උපුටා ලියන්න. ..............................................................................

(ලකුණු 2 X 5 - 10)

# රිච්මන්ඩ් විද්‍යාලය

## 6 ශ්‍රේණිය - සිංහල භාෂාව

## දෙවන වාර පරීක්ෂණය - 2019

- ඔබ කැමති ප්‍රශ්න දෙකක් සඳහා පිළිතුරු සපයන්න.
- ඔබට කියවීමට නිර්දේශ කර ඇති පොත්පත් ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) "වත්තේ ලැයිමෙ ඉන්නකොට වැඩ හම්බ වෙනවා දිගටම එතකොට පඩි හම්බවෙනවා නොවැ"

I. ඉහත ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින්ද?

II. එම ප්‍රකාශය අනුව වතතේ ලැයිමේ ඉන්නේ කවුරුන්දැයි ඔබ සිතනවාද?

(2)

I. "හයිඩි" නම් ළමා නවකතාවෙහි රචකයා කවුරුන්ද?

II. එය සිංහලයට පරිවර්තනය කළ පරිවර්තකයාගේ නම ලියන්න.

(3) "පුංචි අපට දැන් තේරෙයි" යනු සුප්‍රකට ළමා වේදිකා නාට්‍යයකි.

I. මෙය රචනාකොට ඇත්තේ කවුරුන්ද?

II. මෙහි එන ඔබ සිත්ගත් චරිත දෙකක් නම් කරන්න.

(4) "නැවියන් දෙදෙනෙක් නැවේ සුක්කානම ක්‍රියාකරවීමෙහි යෙදී සිටියහ.පුළුල් වූ දෙඋරහිස් හා උස් සිරුරකින් යුත් කප්පිත්තා ඔවුන් එය ක්‍රියා කරවන හැටි බලා සිටියහ..."

I. මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ කුමන ග්‍රන්ථයේද?

II. එය සිංහලට පරිවර්තනය කර ඇත්තේ කවුරුන්ද?

(5)

I. "මැටි ගෙදර ළමයි" නම් ළමා ග්‍රන්ථය රචනා කළේ සුප්‍රකට ලේඛිකාවකි ඇය කවුරුන්ද?

II. එතුමිය දක්ෂතා දැක්වූ තවත් එක් ක්ෂේත්‍රයක් නම් කරන්න.